සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2024
Third Term Test - Grade 12 - 2024

විභාග අංකය: .....................................

# කෘෂි විද්‍යාව - I

කාලය පැය 02 යි

- අංක 01 - 50 දක්වා එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

---

01. වර්ෂාපතනය මනින සම්මත ඒකකය වනුයේ,
    (1) cm (2) m*l* (3) mm
    (4) m (5) *l*

02. ජල චක්‍රයේ සංරචකයන් නො වන්නේ,
    (1) උත්ස්වේදනය (2) වර්ෂණය (3) ඝනීභවනය
    (4) වාෂ්පීභවනය (5) වැස්සීම

03. දේශගුණික සාධකවල බලපෑම අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ,
    (1) බිම් සැකසීම. (2) අතුරු යත් ගෑම. (3) ජල සම්පාදනය.
    (4) පළිබෝධ නාශක භාවිතය. (5) යාන්ත්‍රීකරණය.

04. කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක අත්‍යාවශ්‍ය උපකරණයක් නො වන්නේ,
    (1) සූර්ය දීප්තමානය (2) වර්ෂාමානය (3) පාංශු උෂ්ණත්වමානය
    (4) බැරෝ මීටරය (5) සුළං දිශා දර්ශකය

05. පහත රට තෙත් කලාපය හඳුන්වන සංකේතය වනුයේ,
    (1) WM (2) WL (3) IM
    (4) DM (5) DL

06. දැනට ශ්‍රී ලංකාවේ වවනු ලබන වී වර්ග කිහිපයක් පහත දැක්වේ. ඒවා අතුරින් වැඩි අස්වැන්නක් ලබා දෙන වී වර්ගය කුමක් ද?
    (1) Bg 300 (2) සුවඳැල් (3) කළු හීනටි
    (4) මාවී (5) කුරුළුතුඩ

07. කෘෂි කර්මයේ දී ගොවියාගේ තාක්ෂණය පිළිබඳ ඇති නොදැනුවත් භාවය නිසා ඇති විය හැකි සමාජමය ගැටලුවක් වන්නේ,
    (1) නිසි පළිබෝධ නාශක භාවිතයක් නොමැති වීම.
    (2) බීජ ඒකාධිකාරිය.
    (3) අඩු අස්වනු සහිත බීජ භාවිතය.
    (4) බීජ ජීව්‍යතාව අඩු වීම.
    (5) පසු අස්වනු හානිය වැඩි වීම.

08. හරිත විප්ලවය නිසා කෘෂි ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කමක් නො වන්නේ,

(1) උසස් ප්‍රභේද හඳුන්වා දීම.

(2) අධික යාන්ත්‍රීකරණය.

(3) කාබනික ගොවිතැනට නැඹුරු වීම.

(4) තනි වගාවන් යොදා ගැනීම.

(5) නවීන ජල සම්පාදන ක්‍රම යොදා ගැනීම.

09. හරිත විප්ලවයේ යහපත් ප්‍රතිඵලයක් වන්නේ,

(1) භූමි හායනය වේගවත් වීම.

(2) ස්වභාවිකව ප්‍රතිරෝධිතාව පිරිහීම.

(3) ජෛව විවිධත්වය පරිහානියට පත්වීම.

(4) ආහාර නිෂ්පාදනය වැඩි වීම.

(5) සෞඛ්‍ය ගැටළු මඟ හැරීම.

10. පාෂාණ ජීර්ණයට බලපාන රසායනික සාධකයක් වන්නේ,

(1) උෂ්ණත්වය. (2) සජලනය. (3) උච්චාවචනය.

(4) වර්ෂාපතනය. (5) සතුන් ගුල් හෑරීම.

11. (A) පසෙහි ජලය රඳවා ගැනීමට සංසක්ත බල හා කේෂාකර්ෂණය වැදගත් වේ.

(B) ජලයේ ඇති ධ්‍රැවීයතාව පාංශු ජලය රඳවා ගැනීම කෙරෙහි බලපෑමක් ඇති නො කරයි.

ඉහත ප්‍රකාශ පිළිබඳ නිවැරදි පිළිතුර වනුයේ,

(1) A පමණක් නිවැරදිය.

(2) B පමණක් නිවැරදිය.

(3) A නිවැරදි වන අතර B වැරදියි.

(4) A වැරදි වන අතර B නිවැරදියි.

(5) A හා B යන දෙකම නිවැරදියි.

12. බෝග වගාව සඳහා පාංශු වර්ණය වැදගත් වන්නේ,

(1) වගා කිරීමට උචිත බෝග තීරණය කිරීමට.

(2) බිම් සැකසීමට සුදුසු උපකරණ තීරණය කිරීමට.

(3) පසේ අඩංගු පෝෂක පිළිබඳ දළ අදහසක් ලබා ගැනීමට.

(4) සුදුසු ජල සම්පාදන ක්‍රමයක් තීරණය කිරීමට.

(5) පස සැකසීමට සුදුසු අවස්ථාව තීරණය කිරීමට.

13. පාංශු ඛාදනයේ අහිතකර බලපෑමක් නො වන්නේ,

(1) ශාක වර්ධනය සඳහා සුදුසු පාංශු ස්ථරයේ ඝනකම අඩු වීම.

(2) පස නිසරු වීම.

(3) පසේ සශ්‍රීක ස්ථරයේ ගැඹුර අවම වීම.

(4) කෘෂි කාර්මික ඉඩම් වල අගය අඩු වීම.

(5) පළිබෝධ හානි අවම වීම.

14. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ බහුලවම ව්‍යාප්ත වී ඇති පස් බාණ්ඩය වනුයේ,

(1) රතු දුඹුරු පස (2) රතු කහ ලැටසෝල් පස (3) දියළු පස

(4) දියසිළු පස (5) රතු කහ පොඩ්සොලික් පස

15. බෝග වගාවක ළපටි පත්‍ර දාරය දිගේ මැල වී මිය යාම සිදු වූ අතර පරිණත පත්‍ර තඹ පැහැයක් ගන්නා ලදි. මෙය කිනම් පෝෂකයක ඌනතා ලක්ෂණයක් ද?

(1) MO (2) B (3) N

(4) Cl (5) S

16.




ඉහත ප්‍රස්ථාරයට අනුව වැරදි ප්‍රකාශය වනුයේ,

(1) යොදන පෝෂකවලට 1 කලාපයේ දී ශාකය අධිකව ප්‍රතිචාර දක්වයි.

(2) 2 කලාපයේ දී ශාකය පෝෂක වලට යම්තාක් දුරකට ප්‍රතිචාර දක්වයි.

(3) 5 කලාපයේ දී පෝෂක විෂ වී ඇත.

(4) 4 කලාපයේ දී පෝෂක අවශෝෂණයක් සිදු නො වේ.

(5) 6 කලාපයේ දී ශාකය මිය යාම සිදු වේ.

17. පාංශු පෝෂක පසෙන් ඉවත් වන ආකාරයක් නො වන්නේ,

(1) බෝග මඟින් අවශෝෂණය.

(2) පාංශු ඛාදනය.

(3) ක්ෂරණය මඟින් ඉවත් වීම.

(4) ස්වායු බැක්ටීරියා ක්‍රියාකාරීත්වය.

(5) පෝෂක භෞතරසායනිකව තිර වීම.

18. ශූන්‍ය බිම් සැකසීමේ දී,

(1) ප්‍රාථමික බිම් සැකසීම පමණක් සිදු කරයි.

(2) මුළු භූමි ප්‍රමාණයටම ද්විතියික බිම් සැකසීම සිදු කරයි.

(3) බීජ සිටුවන පේළියට පමණක් ප්‍රාථමික බිම් සැකසීම සිදු කරයි.

(4) බීජ සිටුවන පේළියට හෝ ස්ථානයට පමණක් ද්විතියික බිම් සැකසීම සිදු කරයි.

(5) බිම් සැකසීමක් සිදු නොකරයි.

19. වගා කටයුතු සඳහා ජල ප්‍රභවයක් තෝරා ගැනීමේ දී සළකා බැලිය යුතු කරුණක් නො වන්නේ,

(1) භූ විෂමතාව

(2) ජල ප්‍රභවය පෘෂ්ඨීය ද උපපෘෂ්ඨීය ද යන වග

(3) පිරිවැය.

(4) දැනට යොදාගෙන ඇති ජල සම්පාදන ක්‍රමය.

(5) පසේ කැටායන හුවමාරු ධාරිතාවය.

20. කේන්ද්‍රාපසාරී පොම්ප භාවිතයේ දී මතුවිය හැකි ගැටළුවක් වන්නේ,

(1) නඩත්තු වියදම් වැඩිය.

(2) ඉහළ උසකට ජලය පොම්ප කිරීමේ දී කාර්යක්ෂම නො වේ.

(3) ජලය පිට වීම ඒකාකාරී නො වේ.

(4) මඩ හා වැලි සහිත පොම්ප කළ නොහැක.

(5) අධික පීඩන වලට ඔරොත්තු නොදේ.

21. (A) බිංදු ජල සම්පාදනයේ දී පාංශු ඛාදනය අධිකය.

(B) විසිරි ජල සම්පාදනයේ දී ක්ෂේත්‍රයේ පුරා ඒකාකාරීව ජලය සැපයිය නොහැක.

ඉහත ප්‍රකාශ අතරින්,

(1) A පමණක් නිවැරදිය. (2) B පමණක් නිවැරදිය. (3) ප්‍රකාශ දෙකම වැරදිය.

(4) A නිවැරදි අතර B වැරදිය. (5) B නිවැරදි අතර A වැරදිය.

22. ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාවය යනු,

(1) ක්ෂේත්‍රයට සැපයිය යුතු මුළු ජල ප්‍රමාණය වේ.

(2) පස ක්ෂේත්‍ර ධාරිතාවයෙන් පවත්වා ගැනීමට අවශ්‍ය ජල ප්‍රමණය යි.

(3) ක්ෂේත්‍රධාරිතාව සංතෘප්ත වීමට අවශ්‍ය ජල ප්‍රමාණය යි.

(4) මලානික සංගුණකයේ දී අවශ්‍ය ජල ප්‍රමාණය යි.

(5) ජල ප්‍රභවයෙන් ලබා දිය හැකි උපරිම ජල ප්‍රමාණය යි.

23. දුර්වල ජල වහන තත්ව නිසා,

(1) හට ගන්නා ඵල ප්‍රමාණයට බලපෑමක් නොවේ.

(2) පසේ ලවණතාවය අඩු වේ.

(3) හරිතක්ෂය ඇති වේ.

(4) කාබනික ද්‍රව්‍ය වියෝජනය ඉක්මනින් වේ.

(5) පොටෑසියම් අවශෝෂණය වැඩි වේ.

24. $Ii = \frac{In}{ETC}$ සමීකරණයේ ETC පදයෙන් දැක්වනුයේ,

(1) ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාවයි.

(2) දළ ජල සම්පාදන අවශ්‍යතාවයි.

(3) ශාකය භාවිතා කළ ජල ප්‍රමාණය යි.

(4) බෝග වාෂ්පීකරණ උත්ස්වේදනය යි.

(5) ශාකය භාවිතා කළ පෝෂක ප්‍රමාණය යි.

25. ප්‍රභාසංස්ලේශණයට බලපාන අභ්‍යන්තර සාධකයක් නොවන්නේ,

(1) කාබන්ඩයොක්සයිඩ් සාන්ද්‍රනය

(2) පත්‍ර මධ්‍ය සෛල වල අඩංගු ජල ප්‍රමාණය

(3) පත්‍ර තලයේ පළල

(4) පූටිකා සංඛ්‍යාව

(5) පත්‍රවල වයස

26. (A) ප්‍රභාසංස්ලේෂණයේ දී ආලෝක ප්‍රතික්‍රියාව හරිතලවයේ තෛලකොයිඩ පටලය මත ද අඳුරු ප්‍රතික්‍රියාව පංජරයේ ද සිදු වේ.

(B) අඳුරු ප්‍රතික්‍රියාව ප්‍රධාන පියවර 02 කින් සිදු වේ.

(1) A පමණක් නිවැරදිය. (2) B පමණක් නිවැරදිය. (3) A හා B දෙකම නිවැරදිය.

(4) A නිවැරදි අතර B වැරදිය. (5) A වැරදි අතර B නිවැරදිය.

27. උත්ස්වේදනය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) ඇබ්සිසික් අම්ලය උත්ස්වේදන ක්‍රියාවලිය උත්තේජනය කරයි.

(2) උත්ස්වේදනය හේතුවෙන් ශාකය සිසිල් වීම සිදු වේ.

(3) උත්ස්වේදනය සිදු නොවන විට පෝෂක අවශෝෂණය කාර්යක්ෂමව සිදු වේ.

(4) පැළ හා අතු රෝපණයේ දී ශාක පත්‍ර කපා දැමීමෙන් උත්ස්වේදනය උත්තේජනය කළ හැක.

(5) උත්ස්වේදය ජල චක්‍රයේ සංරචකයක් නො වේ.

28. අක්‍රීය අවශෝෂණය සිදුවන ප්‍රධාන ආකාරයක් නො වන්නේ,

(1) විසරණය. (2) නිපානය. (3) ආස්‍රැතිය.

(4) අරීය පරිවහනය. (5) පහසුකම් සහිත විසරණය.

29. ජලය ශාක කඳ තුළ ඉහළට ගමන්කරන ක්‍රියාවලිය වන්නේ,

(1) විසරණය. (2) උත්ස්වේදනය චූෂණය. (3) මූල පීඩනය.

(4) ආස්‍රැතිය. (5) රසෝද්ගමනය.

30. අග්‍රස්ථ ප්‍රමුඛතාව ඇති කිරීමට වැදගත් වන ශාක හෝමෝන බාණ්ඩය වන්නේ,

(1) ඔක්සීන (2) සයිටොකයිනීන් (3) ගිබරලීන්

(4) ඇබ්සිසික් අම්ලය (5) එතිලීන්

31. ගිබරලීන්වල කාර්යයක් වනුයේ,

(1) පූටිකා වැසීම. (2) ශාක කුරු වීම. (3) ඡායාංග පුෂ්ප ඇති වීම.

(4) පාතනෝත්ඵලනය. (5) පත්‍ර වෘද්ධතාව පාලනය.

32. ශාකයක වර්ධක පාරාමිතියක් නො වන්නේ,

(1) ශාකයේ උස

(2) අතු සංඛ්‍යාව (3) ශාකයේ පුෂ්ප සංඛ්‍යාව

(4) ශාකයේ වියළි බර (5) පත්‍ර ක්ෂේත්‍රඵලය

33. ප්ලැනි මීටරය භාවිතා කරනුයේ,

(1) ශාකයේ උස මැනීමට. (2) වියළි බර මැනීමට. (3) ශාකයේ පරිධිය මැනීමට.

(4) පත්‍ර ක්ෂේත්‍ර ඵලය මැනීමට. (5) පත්‍ර සංඛ්‍යාව මැනීමට.

34. ස්ව පරාගනය සඳහා පුෂ්ප දක්වන අනුවර්තනයක් වන්නේ,

(1) අසමපරිණතිය. (2) ස්ව වන්ධ්‍යතාව. (3) ස්ව අසංගතිය.

(4) ඒක ලිංගික පුෂ්ප ඇති වීම. (5) ද්වි ලිංගික පුෂ්ප දැරීම.

35. අතුරුයත් ගෑම සඳහා යොදාගනු ලබන උපකරණයක් වන්නේ,

(1) උදැල්ල (2) මුල්ලුව (3) තැටි නගුල

(4) රිජරය (5) රොටවේටරය

36. තනි පේළියට මෙන් ම දෙපේලි ක්‍රමයට ද සිටුවන බෝගයක් වනුයේ,

(1) පොල් (2) වී (3) අඹ

(4) කජු (5) අන්නාසි

37. (A) වරණය මගින් ශාක යම් මට්ටමක් දක්වා දියුණු කළ හැකි නමුත්, තවදුරටත් වැඩි දියුණු කිරීමට දෙමුහුම් කිරීම කළ හැක.

(B) එකිනෙකට වෙනස් ජාන සංයුතියකින් යුත් ශාක දෙකක් අතර පරපරාගනයෙන් ජනිතයින් ලබා ගැනීම දෙමුහුම් කිරීම වේ.

(1) A පමණක් නිවැරදිය.

(2) B පමණක් නිවැරදිය.

(3) A නිවැරදි වන අතර B වැරදිය.

(4) B නිවැරදි අතර A වැරදිය.

(5) ප්‍රකාශ දෙකම නිවැරදිය.

38. මින් ස්ථිර ආරක්ෂිත ව්‍යුහය වන්නේ,

(1) හරිතාගාර (2) ලැත් නිවාස (3) ජල සංරක්ෂක ව්‍යුහ
(4) ශීත රාමු (5) පේළි ආවරණය

39. K ලබාදෙන පොහොරයක් වන්නේ,

(1) මියුරේට් ඔෆ් පොටෑෂ් (2) සාන්ද්‍ර සුපර් පොස්පේට් (3) ඇමෝනියම් සල්ෆේට්
(4) එප්පාවල ඇපටයිට් (5) රොක් පොස්පේට්

40. (A) වර්මි කොම්පෝස්ට් සෑදීමට ගැඩවිල් පණුවන් යොදා ගනී.

(B) වර්මි කොම්පෝස්ට් සෑදීම සිදු කරන අවස්ථාවේ දී ටැංකියේ තෙතමන ප්‍රමාණය 85% ට වඩා අඩු විය යුතුය.

ඉහත ප්‍රකාශ අතරින්,

(1) A පමණක් නිවැරදිය.
(2) B පමණක් නිවැරදිය.
(3) A හා B දෙකම නිවැරදිය.
(4) A නිවැරදි අතර B වැරදිය.
(5) A වැරදි අතර B නිවැරදිය.

41. බිම් සැකසීමෙන් පසක,

(1) අහුඹු රළු බව අඩු වේ. (2) දෘශ්‍ය ඝනත්වය අඩු වේ. (3) පාංශු සච්ඡිද්‍රතාව අඩු වේ.
(4) පාංශු ජීවී ගහනය අඩු වේ. (5) පාංශු වාතයනය අඩු වේ.

42. අතුරු යත් ගෑමේ ක්‍රියාවලියක් වන්නේ,

(1) ගස මුලට පස් එකතු කිරීම. (2) ගැඹුරු සී සෑම (3) යටි පස් බුරුල් කිරීම.
(4) වසර පුරා බිම් සැකසීම. (5) පාත්ති සැකසීම.

43. ස්ව පරාගනය මෙන් ම පර පරාගනය ද දක්වන බෝගයක් වන්නේ,

(1) තම්පලා (2) තක්කාලි (3) මෑ
(4) බඩ ඉරිඟු (5) අලි පේර

44. පුෂ්පයක පුමාංගීය කොටසක් වන්නේ,

(1) දළ පත්‍රය (2) සූත්‍රිකාව (3) ඩිම්භ කෝෂය
(4) මණිපත්‍ර (5) කීලය

45. බීජ ජීව්‍යතාව කෙරෙහි බලපාන අභ්‍යන්තර සාධකයක් වන්නේ,

(1) උෂ්ණත්වය
(2) $Co_2$ සාන්ද්‍රණය
(3) ප්‍රවේණික සාධක
(4) වායුගෝලීය සාපේක්ෂ ආද්‍රතාව
(5) වායුගෝලීය පීඩනය

46. ටෙට්‍රාසෝලියම් පරීක්ෂාව සිදුකරනුයේ,

    (1) බීජයේ තෙතමනය මැනීමට.

    (2) බීජයේ $Co_2$ සාන්ද්‍රණය මැනීමට.

    (3) බීජයේ පෝෂක ප්‍රමාණය මැනීමට.

    (4) බීජයේ ජීව්‍යතාව මැනීමට.

    (5) බීජයේ දිලීර ආසාධන හඳුනාගැනීමට.

47. උණු ජල ප්‍රතිකාරයෙන් බීජ සුප්තතාව ඉවත්කරන බීජයක් වනුයේ,

    (1) කරවිල (2) අඹ (3) සියඹලා

    (4) තේක්ක (5) ඇකේෂියා

48. ගොවියෙකු තම වගා බිම සඳහා තෝරාගත් බීජ නීරෝගී බව තහවුරු කළ බීජ නොවේ. ඔහුට ඉදිරියේ දී මුහුණපෑමට සිදුවන ගැටලුවක් නො වන්නේ,

    (1) බෝගයේ පළමු වර්ධන අවධිවල පැළවල දිරිමත් වර්ධනයක් තිබීම.

    (2) පැළ ගහණයේ ඒකාකාරී වර්ධනයක් නොවීම.

    (3) නැවත පැළ සිටුවීමේ අවශ්‍යතාවක් පැන නැගීම.

    (4) බීජ ප්‍රරෝහණ ප්‍රතිශතය අඩු වීම.

    (5) වැඩි බීජ ප්‍රමාණයක් අවශ්‍ය වීම.

49. බිත්තර වී සඳහා බීජ සහතික කිරීමේ සේවයේ පර්යේෂණගාර ප්‍රමිති පහත දැක්වේ. මින් නිවැරදි ප්‍රමිතිය වන්නේ,

    (1) වෙනත් බීජ $< 200 / 500\,g$

    (2) ප්‍රරෝහන ප්‍රතිශතය $> 85\,\%$

    (3) ටෙට්රසෝලියම් පරීක්ෂාව 85%

    (4) තෙතමනය $> 13\%$

    (5) වල් බීජ $50 / 500\,g$

50. ශාක අභිජනනයට යොදා ගන්නා මූලික ක්‍රමයක් නො වන්නේ,

    (1) වරණය. (2) දෙමුහුම් අභිජනනය. (3) විකෘති අභිජනනය.

    (4) ජාන තාක්‍ෂණය. (5) ස්වපරාගනය.